# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2053/26 - 2018 ජනවාරි මස 10 වැනි බදාදා - 2018.01.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

අංක 02/2018 දරන සුරාබදු නිවේදනය

**සුරාබදු නිවේදන අංක 666 හි දැක්වෙන කොන්දේසි සංශෝධනය**

කලින් කලට සංශෝධනය කරන පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරය වූ) 25 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මා විසින් මෙම නිවේදනය මඟින් 1979 දෙසැම්බර් මස 31 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 666 දරන සුරාබදු නිවේදනයෙහි උපලේඛනය,

(1) 5 වැනි ඡේදයේ (v) උපඡේදය අවලංගු කර ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීම,
''(v) වයස අවුරුදු 18 ට අඩු ඕනෑම පුද්ගලයකු'',

(2) ඡේද අංක 11 හි උපඡේද (ඇ) ඉවත් කිරීම, සහ

(3) ඡේද අංක 11 හි උපඡේද (ඈ) උප ඡේද (ඇ) ලෙස නැවත අංකනය කිරීම.

මඟින් සංශෝධනය කරනු ලැබේ.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018 ජනවාරි මස 10 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

01 - 721